0018

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

සමාජ අධ්‍යයන අංශය

තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2021/2022) - 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය - දෙවන වර්ෂ අර්ධය

**DSD3306/SSD1106 – කළමනාකරණ කුසලතා**

කාලය : පැය 02

දිනය - 2023/02/11 වේලාව - පෙ.ව 9.30– පෙ.ව 11.30

උපදෙස් :-

- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න නවයක් (09) ඇත.
- ප්‍රශ්න හතරකකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 කි.
- පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න.

01. ආම්ස්ට්‍රෝං (Armstrong,1999) ට අනුව, "කළමනාකරණය යනු උප ක්‍රියාවලි හතරකට (04) බෙදී ඇති තීරණ ගැනීමේ ක්‍රියාවලියකි". සුදුසු උදාහරණ භාවිතා කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

02. ඔබ පාසලක විදුහල්පතිවරයෙක් යැයි සිතන්න. කළමනාකරුවෙකුගේ යාන්ත්‍රික හා ගතික භූමිකාවන් ගැන සඳහන් කරමින් විදුහල්පතිවරයෙකු ලෙස ඔබේ කාර්යය විශ්ලේෂණය කරන්න.

03. සුදුසු උදාහරණ භාවිතා කරමින් ඔබ ඉගෙන ගත් වැදගත් කළමනාකරණ කුසලතා තුනක් (03) විස්තර කරන්න.

04. ඔබේ ප්‍රදේශයේ රුක් රෝපණ ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට ඔබ අදහස් කරයි. ඊතල රූප සටහන් ක්‍රමය (ADM) භාවිතා කරමින්, එක් එක් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා වැය වන කාලය සැලසුම් කරන්න.

05. හොඳ කළමනාකරුවෙකුගේ ගුණාංග තුනක් (03) විස්තර කරන්න. අවශ්‍ය අවස්ථාවට උදාහරණ භාවිතා කරන්න.

06. රොෂාන් ABC සමාගමට අලුතින් බඳවා ගත් අයෙකි. ඔහු උද්යෝගිමත් පුද්ගලයෙකි. එසේ වුවත් යම් රාජකාරියක් පැවරූ විට, එය මග හැර, වෙනත් දේවල් වලට යොමුවේ. සමහරවිට රාජකාරි වෙලාවේ දී පිල්ම් නරඹමින්, යහළුවන් සමඟ කාලය ගත කරයි. රොෂාන් මුහුණ දෙන ගැටලු හඳුනාගෙන විසඳුම් යෝජනා කරන්න.

07. කළමණාකරණ වෙනස්කම් පිළිබඳ ලෙවින්ස් (Lewin's) ගේ අදියර තුනේ ආකෘතිය සාකච්ඡා කරන්න.

08. "සන්නිවේදනය සංවිධානයක රුධිරය බඳුය". කළමනාකරණය තුළ සන්නිවේදනයේ වැදගත්කම සම්බන්ධයෙන් මෙම ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

09. පහත සඳහන් ඕනෑම හතරක් (04) ගැන කෙටි සටහන් ලියන්න.

අ) රාජ්‍ය නොවන සංවිධාන (NGO)

ආ) කළමනාකරණ ශෛලීන්

ඇ) කාල කළමනාකරණය

ඇ) වැදගත් ප්‍රවේශ විශ්ලේෂණය

ඉ) ක්‍රියාකාරී අධ්‍යාපන චක්‍රයක්

ඊ) සන්නිවේදනයේ Ws පහක්

********* සියලුම හිමිකම් ඇවිරිණි **********